**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 02 - 2019**

---------------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 02 හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ණය ගිවිසුම් අංක 3625 – (එස්ආර්අයි) හි 4.02(අ) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3626 – (සීඕඑල්) හි 04.02(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

---------------------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, මහවැලි කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයෙහි කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීමේ වැඩසටහනෙහි අරමුණු වේ.ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 43,734 කට සමාන එ.ජ.ඩො. මිලියන 242 ක් වූ අතර, ඉන් රු.මිලියන 37,951කට සමාන එ.ජ.ඩො. 210 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රු. මිලියන 5,783 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යයනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2018 ජූලි 23 වන දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය අවසන් කිරීමට නියමිතව ඇත.

**1.3 මතය**

**------**

වැඩසටහනෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණ | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිරිදේශ |
|---|---|---|---|---|
| අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.2 හා 2.3.3(ඇ) ඡේදයන් | ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක පූර්ණ කාලීන පදනමින් බඳවාගත යුතුය. ඉහත චක්‍රලේඛයේ 2.3.3(ඇ) වගන්තියට අනුව යම් කාලපරිච්ඡේදයක නිලධාරියෙකුට එක් ව්‍යාපෘතියක වඩා සේවය කළ නොහැක. කෙසේ වුවද මොරගහකන්ද ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ඉහල ඇලහැර ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස වැඩබලන පදනම මත පත්කර තිබුණි. | ව්‍යාපෘති පරිපාලන ගැටලු පැන නැඟිය හැකි අතර කාර්ය සාධනය අඩුවිය හැකිය. | මොරගහකන්ද ව්‍යාපෘතිය නිමවෙමින් පවතින අතර මොරගහකන්ද සහ ඉහළ ඇලහැර ව්‍යාපෘති ඉතා සමීපව පිහිටා ඇත. මොරගහකන්ද ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව ඔහුට ඉහල ඇලහැර ව්‍යාපෘතියේ පූර්ණ කාලීනව ක්‍රියාකිරීමට හැකි වන අතර ඉහළ ඇලහැර ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ පත් කිරීම PS 2 මට්ටමේ තනතුරකි. වැඩසටහන මඟින් ව්‍යාපෘති අධ්‍යක්ෂ පත්කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අනුමැතිය ඉල්ලා සිටින ලදි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පිලිතුර අනුව පියවරගනු ලබයි. මෙම ගැටලුව විසඳන තෙක් ඔහුගේ වැඩබැලීමේ වැටුප් ගෙවීම වැඩසටහන විසින් නවතා දමා ඇත. | වැඩසටහන් චක්‍රලේඛ මාර්ගෝපදේශ අනුගමනය කල යුතුය. |

**3. කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (a) | කළුගඟ හා මොරගහකන්ද ජලාශ සම්බන්ධිත උමං මාර්ගය ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 51 ක් අපේක්ෂා කළද, 2019 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය සියයට 28 ක් පමණක් විය. තවද ඉහත කොන්ත්‍රාත්තුවේ පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා රුපියල් මිලියන 15.3 වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 0.7 ක් පමණක් උපයෝගී කරගෙන කිරීමෙන් පාරිසරික ආරක්ෂාව සඳහා කොන්ත්‍රාත්කරුගේ දායකත්වය අවම මට්ටමක පැවතුනි. | අත්තිකාරම් වැරදි ලෙස යෙදවීමට හැකිය. | ප්‍රකාශයට යටත්ව එකඟ වෙමි. 2020 මැයි මස අවසන් වන විට භෞතික ප්‍රගතිය සියයට 35 වන අතර වැඩසටහන කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. අවම කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා රේඛීය ආයතනවලින් (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) නිර්දේශ / අනුමැතිය ලබා ගැනීමේදී ප්‍රමාද විය. | කොන්ත්‍රාත් වැඩ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (b) | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන අදියර -2 හි ණය ගිවිසුම 2018 වර්ෂයේදී අත්සන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 2 කින් පසුවද NWPC – ICB – 01 හා UECP – ICB - 02A යන කොන්ත්‍රාත් පැකේජයන් ප්‍රදානය කර නොතිබුණි. තවද ඉහත කොන්ත්‍රාත් පැකේජවල කිසිදු | ආර්ථික නොවන වියදම් වැඩි විය හැකිය. | ප්‍රකාශයට යටත්ව එකඟ වෙමි. NWPC – ICB – 01 කොන්ත්‍රාත්තුව 2020 තුන්වන කාර්තුවේදී ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. | ණය ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | භෞතික ප්‍රගතියක් අත්කර නොගෙන රුපියල් මිලියන 81 ක් පොලී හා කැපවීමේ ගාස්තු ණයදෙන ආයතනය විසින් අයකරගෙන තිබුණි. | | | |
| (c) | 2020 ජනවාරියේ පැවති ආසියානු සංවර්ධන බැංකුවේ ඒකාබද්ධ ණය සමාලෝචිත රැස්වීම් වාර්තා අනුව, ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 675 සිට ඇමරිකානු ඩොලර් මිලියන 947.3 දක්වා සියයට 40 කින් වැඩි වී තිබුණි. එබැවින් පළමු අදියරයෙන් කොන්ත්‍රාත් UECP – ICB – 5 හා NWPC – ICB – 3 ඉවත් කිරිමට යෝජනා කරතිබූ අතර පිරිවැය අඩු කිරීම සඳහා 2 වන කොටසට ඇතුලත් කරන ලදි. කෙසේ වෙතත් 1 කොටසින් ඉහත කොන්ත්‍රාත් පැකේජ 2 ක ඉවත් කිරීමේ බලපෑම වැඩසටහන මඟින් තක්සේරු කර නොතිබුණි. | වැඩසටහන් පිරිවැය ඉක්මවායාම සහ වැඩසටහන අපේක්ෂිත ප්‍රතිලාභ අවම කරගත හැකිය. | ප්‍රකාශයට යටත්ව එකඟවෙමි. වැඩසටහනේ දැනට පවතින අරමුදල් ඇමරිකානු ඩොලර් මිලියන 561 ක් පමණි. අපේක්ෂිත සම මූල්‍ය නොතිබීම හේතුවෙන්. පවතින අරමුදල්වලින් වැඩසටහන ප්‍රතිව්‍යුහ ගත කිරීමට රජය තීරණය කර තිබුණි. | අනුමත වැඩසටහන්වල පිරිවැය ඇස්තමේන්තුව තුල සියලුම කොන්ත්‍රාත් පැකේජයන් ක්‍රියාත්මක කල යුතුය. |